// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2417/47 - 2025 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2025.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**මුලටියන ප්‍රාදේශීය සභාව**

විනෝද බද්ද

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතින් ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් සියයට දහයක (10%) විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මුලටියන ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණ පොතෙහි තීරණ අංක 2024/04/05/01 හි සඳහන් කර, තීරණය කර ඇති තීරණය, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්. කේ. බන්දුල හරිස්චන්ද්‍ර වන මම 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**එම්. කේ. බන්දුල හරිස්චන්ද්‍ර,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2024 ඔක්තෝබර් මස 29 වැනි දින,
ගාල්ල,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

1A - PG 6979 –07 (2025/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## තීරණය

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද පනතේ 2(1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මුලටියන ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 10% (සියයට දහයක) ට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අය කළ යුතු යැයි ද, මෙම යෝජනා සම්මතය *ගැසට් පත්‍රයේ* පළ කරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරන්නී ය. එසේම ඉහත පනවන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරු විසින් නිසි ලෙස මුලටියන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මුලටියන ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් තීරණය කරන ලදී.

EOG 01 - 0040

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.